තොරතුරු මාසිකය

**2025 ඔක්තෝබර්**
**ජනතා විමුක්ති පෙරමුණේ**
**අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.**

# විමර්ශන

**ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!**

# උද්ධමනය පාලනය වූ වසරක්

**ශ්‍රී ලංකාවේ වසර කිහිපයක සිට තීව්‍ර වූ ආර්ථික අර්බුදය නිසාම ආර්ථිකයේ භාණ්ඩ හා සේවා මිල සෑම වසරකම අඛණ්ඩව ඉහළ ගියේය. විශේෂයෙන්ම අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල නිරන්තරයෙන් ඉහළ ගිය අතර එනිසාම උද්ධමනයද සෑම වසරකම ඉහළ ගියේය. උද්ධමනය යන්න අප නිර්වචනය කරන්නේද වසර කිහිපයක භාණ්ඩ හා සේවා මිල ඉහළ යාම ලෙස වන නිසා ලංකාවේ තිබුණේ අඛණ්ඩ උද්ධමනයකි.**

එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසුන්ගේ ජීවන වියදම ඉහළ ගිය අතර බහුතර ජනතාවකගේ ජීවන තත්ත්වය පහළ ගියේය. එහෙත්, වර්තමාන රජය පත්වූදා සිට නිවැරැදි ආර්ථික කළමනාකරණය මත ආර්ථිකය මතවූ උද්ධමන පීඩනය අවම කිරීමට සමත් විය.

2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේදී භාණ්ඩ හා සේවාවල මිල විශාල වෙනස්කම්වලට භාජනය නොවී පවත්වාගෙන යාමට රජය සමත් විය. බොහෝ භාණ්ඩ හා සේවාවල මිල පහළ ගොස් තිබූ අතර, වසර පුරාම උද්ධමනය පාලනය කර ගැනීමට සමත් විය. මෙය 2024 අගෝස්තු මාසයේ මිල ගණන් සමඟ සසඳන කල පැහැදිලිව දැකගත හැකි අතර, අත්‍යවශ්‍ය ආහාර වර්ග කිහිපයකම මිල පසුගිය වසරට වඩා පහළ ගොස් ඇත. එහෙත්, භාණ්ඩ මිල ඉහළ ගොස් ඇතැයි පවතින සාකච්ඡාව මෙම සංඛ්‍යා දත්ත දෙස බැලීමෙන් පැහැදිලි වන්නේ එලෙස මිල ඉහළ ගොස් නොමැති බවයි.

අංක 01 සහ 02 වගුවලට අනුව සහල් වර්ගවල පමණක් මිල සුළු වශයෙන් ඉහළ ගොස් ඇතත්, අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය කිහිපයකම මිල පහළ ගොස් ඇත. සාමාන්‍යයෙන් මෙවැනි ආහාර වර්ගවල මිල අඛණ්ඩව ඉහළ යාමක් පසුගිය කාලයේ දක්නට ලැබුණත්, දැන් එම තත්ත්වය සමනය වීගෙන යන බවක් දැකිය හැකිය.

**වගු අංක 01**

| 2024 අගෝස්තු මාසයට සාපේක්ෂව 2025 අගෝස්තු මාසයේ භාණ්ඩ වර්ග කිහිපයක කිලෝග්‍රෑම් 01ක මිල ගණන් පැවැති ආකාරය: | | | |
|---|---|---|---|
| **භාණ්ඩ වර්ගය** | **2024 අගෝස්තු** | **2025 අගෝස්තු** | **% වෙනස** |
| **සම්බා** | 240.00 | 250.00 | 4.2 |
| **නාඩු** | 220.00 | 230.00 | 4.5 |
| **රතු කැකුළු** | 210.00 | 220.00 | 4.8 |
| **වියළි මිරිස්** | 850.00 | 640.00 | -24.7 |
| **රතුලූනු දේශීය** | 360.71 | 287.50 | -20.3 |
| **රතුලූනු ආනයනික** | 397.50 | 365.00 | -8.1 |
| **ලොකුලූනු ආනයනික** | 234.68 | 151.50 | -35.4 |
| **පරිප්පු** | 298.10 | 270.00 | -9.4 |
| **අර්තාපල් දේශීය** | 441.43 | 357.00 | -19.1 |
| **බිත්තර** | 39.31 | 29.75 | -24.3 |
| **සුදු සීනි** | 270.00 | 220.00 | -18.5 |

**වගු අංක 02**

| 30.09.2025 දිනට කොළඹ පිටකොටුවේ මිල ගණන් – (කි.ග්‍රෑ. 01) | | | |
|---|---|---|---|
| **භාණ්ඩ වර්ගය** | **සිල්ලර** | **තොග** | **මිලෙහි % වෙනස** |
| **වියළි මිරිස්** | 700 | 600 | 16% |
| **රතුලූනු දේශීය** | 350 | 233 | 50% |
| **ලොකුලූනු දේශීය** | 150 | 133 | 12% |
| **අර්තාපල් දේශීය** | 340 | 243 | 40% |
| **බෝංචි** | 350 | 300 | 16% |
| **කැරට්** | 200 | 150 | 33% |

ඒ අනුව ජාතික පාරිභෝගික මිල දර්ශකය සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය ඉතා සුළු වශයෙන් ඉහළ ගොස් තිබේ. එය අංක 03 වගුවේ සංඛ්‍යා සටහනින් පැහැදිලි කළ හැකිය. මෙම මිල දර්ශක දෙකද පසුගිය වර්ෂවල ඉතා විශාල ලෙස ඉහළ ගිය අතර, රට තුළ විශාල උද්ධමන තත්ත්වයක් පැවැති බව දක්නට ලැබිණි.

ඒ අතර, 2025 අගෝස්තු මාසයට සාපේක්ෂව සැප්තැම්බර් මාසයේ මෙම අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල තව දුරටත් පහළ ගොස් තිබිණි. එය පහත සංඛ්‍යා ආශ්‍රයෙන් පැහැදිලි කළ හැකිය.

ඉහත සංඛ්‍යාලේඛනයට අනුව සැප්තැම්බර් මාසයේ මිල පහළ ගොස් තිබුණ ද, ආර්ථිකයේ භාණ්ඩ හා සේවා මිල තවමත් තීරණය කරනු ලබන්නේ විශාල පෞද්ගලික අංශයකින් නිසා පාරිභෝගිකයාට සාධාරණ මිලකට භාණ්ඩ මිලදී ගැනීමේ අවස්ථාව තවමත් අහිමි වී තිබේ. රටක විශාල පෞද්ගලික අංශයක් පැවැතීම සහ එය පාලනය කිරීමේ සීමාවන් සීමාසහිත වන අවස්ථාවක ඕනෑම රටක ආර්ථිකයක් මෙවැනි තත්ත්වයකට මුහුණ දේ. ඉහත සංඛ්‍යාලේඛනයට අදාළව එකම වෙළෙඳපොළක දී භාණ්ඩයක තොග මිල සහ සිල්ලර මිල අතර විශාල පරතරයක් පැවැතීම දැකිය හැකි අතර, එය පාරිභෝගිකයාට අතිශය අවාසිදායකය. පාරිභෝගික මිල සහ තොග මිල අතර වෙනසට අතරමැදියාගේ ලාභය, ප්‍රවාහන වියදම් සහ අනෙකුත් පරිපාලන වියදම් ඇතුළත් වුවත්, බොහෝ අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් වැඩි ලාභයක් තබා ගැනීමෙන් මෙලෙස වෙළෙඳපොළේදී පාරිභෝගිකයාට වැඩි මිලක් ගෙවීමට

07 පිටුව

# 2025 මුල් මාස 07 තුළ වාර්තාගත අපනයන ආදායමක්

**පසුගිය වසර කිහිපයක් පුරාවට කඩාවැටුණ මෙරට ආර්ථිකය ගොඩගැනීම සඳහා ගන්නා ලද එක් ප්‍රවේශයක් වන වෙළෙඳපොළ ප්‍රවේශය පුළුල් කිරීමට ගත් උපායමාර්ගික උත්සාහයන්ගේ ධනාත්මක බලපෑම පිළිබිඹු කරමින්, මෙම වසරේ පළමු මාස 7 තුළ මෙරට සමස්ත අපනයන ආදායම ඩොලර් බිලියන 9.99ක අගයකට (ආසන්න වශයෙන් ඩොලර් බිලියන 10කට) ළඟා වී ඇත. එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 7.79ක වර්ධනයකි.**




මේ වසරේ ජනවාරි සිට ජූලි මාසය දක්වා වෙළෙඳ භාණ්ඩ අපනයන ආදායම ඩොලර් බිලියන 7.8ක් ලෙස වාර්තා වී ඇත. එය පසුගිය වසරේ මුල් මාස හතට සාපේක්ෂව සියයට 7.22ක වර්ධනයකි.

එමෙන්ම, මේ වසරේ ජූලි මාසයේ සමස්ත වෙළෙඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායම ඩොලර් බිලියන 1.64ක් වන අතර, එය පසුගිය වසරේ ජූලි මාසයට සාපේක්ෂව සියයට 12.68ක වාර්ෂික වර්ධනයක් පෙන්වයි. (01 වගුව)

මෙම සමස්ත අපනයන වර්ධනයට ශක්තියක් වෙමින් මෙම වසරේ මුල් මාස 07 තුළ ඩොලර් බිලියන 2.19ක සේවා අපනයන ආදායමක් උපයාගෙන ඇති අතර, එය පසුගිය වසරේ මුල් මාස 7ට සාපේක්ෂව සියයට 9.86ක වර්ධනයකි.

අපනයන සංවර්ධන මණ්ඩලය නිකුත් කළ දත්ත වාර්තාවට අනුව වෙළෙඳ භාණ්ඩ අපනයන අංශයෙන් මෙම වසරේ පළමු මාස 07 තුළ උපයන ලද අපනයන ආදායමේ ප්‍රමුඛතාව අනුව අපනයන භාණ්ඩ හා සේවා පෙළගැස්වීමක් ඉහත වගුවෙන් පෙන්වා දිය හැකිය. ඒ අනුව මෙම වසරේ වැඩිම අපනයන ආදායමක් උපයා ඇත්තේ ඇඟලුම් හා රෙදිපිළි නිෂ්පාදනවලිනි. එය ඩොලර් බිලියන 3.07කි. එය පසුගිය වසරේ පළමු මාස 7 තුළදී මෙම අංශයෙන් උපයා ඇති අපනයන ආදායම වන ඩොලර් බිලියන 2.84ට සාපේක්ෂව සියයට 8.18ක වර්ධනයකි.

එමෙන් ම සේවා අපනයනයෙන්, ප්‍රවාහන හා කාර්යයෝපාය සේවාවන් අපනයනයෙන් මෙම වසරේ පළමු මාස 7 තුළදී ඩොලර් බිලියන 1.19ක් උපයා දී ඇති අතර, එය පසුගිය වසරේ පළමු මාස 7 තුළදී උපයා ඇති ඩොලර් බිලියන 0.98ට සාපේක්ෂව සියයට 21.24ක වර්ධනයකි. (02 වගුව)

**වෙළෙඳ භාණ්ඩ හා සේවා අයිතමයන්ගේ අපනයන කාර්යසාධනය (ඇ.ඩො.මි.) (01 වගුව)**

| රට | 2024 ජන-මාර්තු | 2025 ජන - මාර්තු | වර්ධනය (%) | 2024 මාර්තු | 2025 මාර්තු | වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|
| එක්සත් ජනපදය | 1,638.78 | 1,709.06 | 4.29 | 267.02 | 274.07 | 2.64 |
| ඉන්දියාව | 491.68 | 624.31 | 26.97 | 92.10 | 118.69 | 28.87 |
| එක්සත් රාජධානිය | 527.01 | 565.29 | 7.26 | 74.40 | 81.37 | 9.37 |
| ජර්මනිය | 337.89 | 379.88 | 12.43 | 40.26 | 63.51 | 57.75 |
| ඉතාලිය | 360.29 | 420.69 | 16.76 | 52.58 | 72.55 | 37.98 |
| එ.අ. එමීර් රාජ්‍යය | 214.87 | 265.57 | 23.60 | 33.86 | 43.91 | 29.68 |
| චීනය | 151.15 | 160.68 | 6.30 | 26.24 | 30.64 | 16.77 |
| ප්‍රංශය | 148.48 | 157.68 | 6.20 | 22.45 | 24.51 | 9.18 |
| ඕස්ට්‍රේලියාව | 139.43 | 147.46 | 5.76 | 21.88 | 23.83 | 8.91 |
| බෙල්ජියම | 130.73 | 139.30 | 6.56 | 19.90 | 24.37 | 22.46 |
| ජපානය | 101.26 | 107.93 | 6.59 | 14.09 | 17.89 | 26.97 |
| තුර්කිය | 100.98 | 107.46 | 6.42 | 11.43 | 14.46 | 26.51 |
| වෙනත් වෙළෙඳපොළ | 2,460.12 | 2,567.34 | 4.36 | 377.90 | 436.95 | 15.63 |

| ඉහළම අපනයන ගමනාන්ත හා වෙළෙඳ භාණ්ඩ අපනයන කාර්යසාධනය (ඇ.ඩො.මි.) (02 වගුව) | | | | | | |
|---|---|---|---|---|---|---|
| භාණ්ඩ හා සේවා | 2024 ජන-ජූලි | 2025 ජන-ජූලි | වර්ධනය (%) | 2024 ජූලි | 2025 ජූලි | වර්ධනය (%) |
| ඇඟළුම් සහ රෙදිපිළි | 2,846.90 | 3,079.76 | 8.18 | 443.74 | 479.90 | 8.15 |
| තේ ආශ්‍රිත නිෂ්පාදන | 811.71 | 884.09 | 8.92 | 124.70 | 141.02 | 13.09 |
| පොල් ආශ්‍රිත නිෂ්පාදන | 480.99 | 660.61 | 37.34 | 75.66 | 123.97 | 63.85 |
| සැකසූ ආහාර පාන වර්ග | 274.98 | 339.85 | 23.59 | 37.04 | 60.92 | 64.47 |
| එළවළු | 17.29 | 20.67 | 19.55 | 2.31 | 6.36 | 175.32 |
| පළතුරු | 23.23 | 27.11 | 16.70 | 3.49 | 6.64 | 90.26 |
| වෙනත් අපනයන බෝග | 40.90 | 48.60 | 18.83 | 4.93 | 9.91 | 101.01 |
| මල් සහ ශාක පත්‍ර | 8.26 | 8.67 | 4.96 | 0.98 | 2.19 | 123.47 |
| වෙනත් | 667.40 | 705.44 | 5.70 | 98.94 | 114.76 | 15.99 |
| සේවා අපනයනය | | | | | | |
| ප්‍රවාහන සහ කාර්යයෝපාය සේවා | 982.57 | 1,191.25 | 21.24 | 156.34 | 178.74 | 14.33 |

මෙම වසරේ පළමු මාස 3 තුළ වැඩිම අපනයන ආදායමක් උපයා ඇත්තේ, ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයනය කරන ලද ඇඟලුම් හා රෙදිපිළි ආශ්‍රිත නිෂ්පාදනවලිනි. එය ඩොලර් බිලියන 1.70කි. එය පසුගිය වසරේ පළමු මාස 3 තුළදී ඇමෙරිකා එක්සත් ජනපදයට කරන ලද අපනයනවලින් උපයා ඇති අපනයන ආදායම වන ඩොලර් බිලියන 1.63ට සාපේක්ෂව සියයට 4.29ක වර්ධනයකි.

අංක 03 වගුවෙන් පෙන්වා දී ඇති පරිදි, මෙම වසරේ ජනවාරි මස සිට මැයි මාසය දක්වා වූ පළමු මාස 5 තුළ වැඩිම අපනයන ආදායමක් උපයා ඇත්තේ, 'නැෆ්ටා' (NAFTA - එක්සත් ජනපදය, කැනඩාව, මෙක්සිකෝව) රටවල් අයත් කලාපයෙනි. එය ඩොලර් බිලියන 1.98කි. පසුගිය වසරේ පළමු මාස 5 තුළදී එම කලාපයෙන් උපයා ඇති අපනයන ආදායම වන ඩොලර් බිලියන 1.92ට සාපේක්ෂව එය සියයට 3.19ක වර්ධනයකි.

එහෙත්, පසුගිය වර්ෂයේ මුල් මාස 5ට සාපේක්ෂව යුරෝපා සංගමයේ රටවල් අශ්‍රිතව වැඩිම අපනයන ආදායම් පරතරයක් සහිතව අපනයන ආදායමක් උපයාගෙන ඇති බව ඉහත තොරතුරු විශ්ලේෂණයේ දී පැහැදිලි වේ. එය ඩොලර් මිලියන (1,773.72 - 1,533.63) 240.09කි. 2024 මුල් මාස 05ට සාපේක්ෂව 2025 මුල් මාස 5 තුළ ප්‍රතිශතයක් ලෙස එම අපනයන ආදායමේ වර්ධනය සියයට 15.64කි.

එය මේ වසරේ මැයි මාසය සැලකිල්ලට ගැනීමේදී 'නැෆ්ටා' (NAFTA) කලාපය හා යුරෝපා සංගමය ඇතුළු රටවලට කරන ලද භාණ්ඩ හා සේවා අපනයනවල වටිනාකම පිළිවෙළින් ඩොලර් මිලියන 321.98ක් හා 310.56කි. එය පසුගිය වසරේ මැයි මාසය හා සැසැඳීමේදී පිළිවෙළින් සියයට 3.93ක හා සියයට 40.39ක වර්ධනයකි.

නව ආණ්ඩුව විසින් අපනයනකරුවන්ට ඉහළ අපනයන ඉලක්ක ලබා දීමත්, තරගකාරීත්වය දිරිගැන්වීමත්, විශේෂයෙන් ඩිජිටල් ආර්ථික ව්‍යවසායයන්ට බදු පහසුකම් සැලැසීමත්, අපනයන ක්‍රියාවලියේ හඳුනා ගත් බාධාකාරී ස්ථාන බොහෝ දුරට නිරාකරණය කර දීමත්, නව ගෝලීය වෙළෙඳපොළ අවස්ථා විවර වීමත් මෙම අපනයනවල ප්‍රමාණය සහ ආදායම් ඉහළ යාමට හේතු වී ඇත.

| අපනයන සංවර්ධන මණ්ඩලය නිකුත් කළ දත්ත වාර්තාවට අනුව, ඒ ඒ කලාපයන් අනුව වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය (ඇ.ඩො.මිලි.) (03 වගුව) | | | | | | |
|---|---|---|---|---|---|---|
| කලාපය | 2024 ජන-මැයි | 2025 ජන-මැයි | වර්ධනය (%) | 2024 මැයි | 2025 මැයි | වර්ධනය (%) |
| 'නැෆ්ටා' (NAFTA) රටවල් | 1,921.91 | 1,983.20 | 3.19 | 309.81 | 321.98 | 3.93 |
| යුරෝපා සංගමය (EU) | 1,533.72 | 1,773.63 | 15.64 | 221.22 | 310.56 | 40.39 |
| දකුණු ආසියාව | 747.49 | 818.5 | 9.50 | 131.36 | 157.61 | 19.98 |
| අප්‍රිකානු රටවල් | 169.51 | 234.29 | 38.22 | 26.5 | 40.55 | 53.02 |
| අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN) | 211.28 | 249.19 | 17.94 | 49.67 | 51.03 | 2.74 |
| වෙනත් | 1,946.25 | 1,982.14 | 1.84 | 272.72 | 300.08 | 10.03 |

# මානව පරිණාමය පිළිබඳ නූ

**පසුගිය කලාපය හා සම්බන්ධයි**

## හෝමෝ සේපියන් (*Homo Sapiens*)

අතීතයේ මානව විශේෂ ගණනාවක් මිහිමත ජීවත් වුව ද, විටෙක එකම කාලවකවානුවේ විවිධ ප්‍රදේශවල විවිධ මානව විශේෂ වාසය කළ ද, අද ලොව පුරා විසිර සිටින එකම මානව විශේෂය හෝමෝ සේපියන් පමණක් වේ. මෙම මානව විශේෂය බිහි වන්නට ඇත්තේ, අදින් වසර ලක්ෂ 3කට පමණ පෙර විය හැකි බව පොදු පිළිගැනීමයි. මෙම හෝමෝ සේපියන් විශේෂය ද ජීව විද්‍යාත්මක මෙන්ම සංස්කෘතික වෙනස්කම් මත මූලික කොටස් දෙකකට වෙන් කොට හඳුනා ගනී. ඒ අනුව 'ආදි හෝමෝ සේපියන්' වසර ලක්ෂ 3කට පමණ පෙර බිහි වී, පරිණාමයට ලක්ව අදින් වසර 1,60,000කට පමණ පෙර 'නූතන හෝමෝ සේපියන්' බිහි වන්නට ඇතැයි විශ්වාස කෙරේ. ලතින් භාෂාවෙන් 'බුද්ධිමත් මිනිසා' යන අරුත් සහිතව හෝමෝ සේපියන් යන නාමකරණය සිදු කර ඇත. මුල්ම වරට මෙම නාමකරණය සිදු කරන ලද්දේ ස්වීඩන ජාතික ජීව විද්‍යාඥයකු වූ කාල් ලීනස් විසින් 1735 දී ය.

මීට අමතරව හෝමෝ සේපියන් විශේෂය හැඳින්වීමට තවත් විවිධ නම් භාවිත වේ. උදාහරණයක් ලෙස අදින් අවුරුදු 40,000ත් 10,000ත් අතර කාලයේ දී යුරෝපයේ ජීවත් වූ හෝමෝ සේපියන්ලා හැඳින්වීමට 'ක්‍රොමැග්නන් මානවයා' යන්න භාවිත කෙරේ. එමෙන්ම 'ආදි හෝමෝ සේපියන්' සමහර විද්‍යාඥයන් විසින් වෙනම මානව විශේෂයක් ලෙස හඳුන්වනු ලබන අතර, ඔවුනට 'හෝමෝ හෙල්මෙයි' යන නාමකරණය කර ඇත. එසේම හෝමෝ සේපියන් සහ නියැන්ඩර්තාල් යන මානව විශේෂ දෙකම එකම පොදු කුලකයක් ලෙස හඳුන්වන සමහර විද්‍යාඥයෝ 'නූතන හෝමෝ සේපියන්' විශේෂය හෝමෝ සේපියන් සේපියන් ලෙස ද හඳුන්වති. ඔවුන්ගේ මේ වර්ගීකරණය අනුව නියැන්ඩර්තාල් මානවයා 'හෝමෝ සේපියන් නියැන්ඩර්තැලෙන්සිස්' ලෙස නම් කෙරේ.

හෝමෝ සේපියන් මානව විශේෂය පරිණාමය වූයේ 'හෝමෝ හෙයිඩල්බර්ජෙන්සිස්' මානව විශේෂයෙන් බව පොදු පිළිගැනීමයි. පැරණිම හෝමෝ සේපියන් මානව පොසිල හමු වන්නේ අප්‍රිකානු භූමියෙන් නිසා මෙම විශේෂය බිහි වූයේ ද අප්‍රිකානු මහාද්වීපය තුළම බව පෙනී යයි. ලොව පුරා විවිධ ප්‍රදේශවල හෝමෝ සේපියන් පරිණාමය සිදු වූ බවට සමහර විද්‍යාඥයන් විසින් පෙර දී අදහස් පළ කරනු ලැබ තිබුණ ද, ජාන පර්යේෂණ හරහා තහවුරු වී ඇත්තේ හෝමෝ සේපියන් පරිණාමයේ ආරම්භය එක් මූලයක් පමණක් දක්වා දිවෙන බවයි.

වසර 2,60,000ක් පැරණි දකුණු අප්‍රිකාවේ ෆ්ලොරිස්බෑඩ් ප්‍රදේශයෙන් හමු වූ හෝමෝ සේපියන් හිස්කබලක කොටස් හෝමෝ හෙයිඩල්බර්ජෙන්සිස් හා සේපියන් අතර අතරමැදි ලක්ෂණ පෙන්නුම් කරයි. එමෙන්ම ටැන්සානියාවේ ලැටොලි ප්‍රදේශයෙන් හමු වූ වසර 1,20,000ක් පමණ පැරණි යැයි සැලැකෙන හිස්කබල ද එවැනිම ලක්ෂණවලින් යුක්ත ය. එනම්, පූර්ව මානව විශේෂයන්ගේ ලක්ෂණ මෙන්ම නූතන මානවයාගේ ලක්ෂණ ද ඇතුළත් ය. ඉතියෝපියාවේ ඔමෝ කිබිෂ් ප්‍රදේශයෙන් ද වසර 1,95,000ක් පැරණි එවැනිම ලක්ෂණ සහිත හිස්කබලක් හමු වී තිබේ.



**හෝමෝ හෙයිඩල්බර්ජෙන්සිස් පරිණාමය වී හෝමෝ සේපියන් බිහිවීමේ ආරම්භක අවධිය පෙන්වන දකුණු අප්‍රිකාවේ ෆ්ලොරිස්බෑඩ් ප්‍රදේශයෙන් හමුවූ හිස්කබලක්**

'ආදි හෝමෝ සේපියන්' මානවයා 'නූතන හෝමෝ සේපියන්' මානවයා බවට පරිණාමය වීමේ දී පැරණි ලක්ෂණ ක්‍රමානුකූලව අඩු වෙමින් ගොස් ඇති ආකාරය දැකිය හැකි ය. 'ආදි හෝමෝ සේපියන්' මානවයා වඩා ඝන හිස්කබලක්, වඩා ශක්තිමත් අස්ථි, වැඩුණු ශරීරයක් සහිත වෙද්දී 'නූතන හෝමෝ සේපියන්' සතුව ඇත්තේ සාපේක්ෂව තුනී හිස්කබලක් සහ සාපේක්ෂව කුඩා ශරීරයක් ය. එමෙන්ම 'නූතන හෝමෝ සේපියන්' මානවයාට වඩා වටකුරු හිස්කබලක් සහ සිරස් නළලක් හිමි ව ඇත.



**හෝමෝ සේපියන් මානවයින් විසින් ඇඳුම් පිළියෙල කිරීම සඳහා භාවිතා කළ ඉඳිකටු සහ උපකරණ**


හෝමෝ සේපියන් විසින් මුල් කාලයේ නිර්මාණය කරන ලද ගල් ආයුධ නියැන්ඩර්තාල් මානවයා නිර්මාණය කළ ආයුධවලට බොහෝ සෙයින් සමාන විය. තියුණු මෙන්ම උල් ආයුධ නිර්මාණය කිරීමට ඔවුහු දක්ෂ වූහ. මෙවැනි ආයුධ නිර්මාණය කිරීමට නම්, පියවර කිහිපයක් සැලැසුම්සහගතව අවසන් කළ යුතුව තිබූ අතර, එලෙස සැලැසුම් කිරීමට හැකි මට්ටමේ



**ජර්මනියේ Hohle Fels ගුහාවෙන් හමුවූ හෝමෝ සේපියන් මානවයා විසින් නිර්මාණය කරන ලද පැරණිතම කාන්තා රූව**

# තන ගවේෂණ 16 - කොටස

චින්තන හැකියාවක් ඔවුන් සතුවූ බව ඉන් පැහැදිලි වේ. ගල් ආයුධවලට අමතරව සතුන්ගේ ඇටකටු, ඇත්දළ, අං ආදී දේ හරහා ද ඔවුන් විසින් ආයුධ නිර්මාණය කර තිබිණි. සියුම් කටයුතු පවා කළ හැකි ආකාරයේ ආයුධ නිපැදවිය හැකි මට්ටමට ක්‍රමානුකූලව මෙම හැකියාව වර්ධනය විය. අදින් වසර ලක්ෂයකට පමණ පෙර දිගු තල සහිත පිහි, තියුණු හෙළි තුඩු ආදිය හෝමෝ සේපියන් මානවයා විසින් නිර්මාණය කරනු ලැබ තිබිණි.




**හෝමෝ සේපියන් මානවයා ලොව පුරා පැතිරගිය ආකාරය සහ නියැන්ඩතාල් හා හෝමෝ ඉරෙක්ටස් මානවයින් ඒ වනවිට පැතිර සිටි ප්‍රදේශ**

අනෙකුත් මානව විශේෂවලට සාපේක්ෂව ගින්දර වඩා හොඳින් පාලනය කිරීමේ විශේෂ හැකියාවක් හෝමෝ සේපියන් සතු විය. සංකීර්ණ ගිනි උදුන් මෙන්ම පෝරණු පවා ඔවුහු භාවිත කළහ. අදින් වසර 26,000කට පමණ පෙරදීත් සෙල්සියස් අංශක 400ක් වැනි උෂ්ණත්වයකින් මැටි පිළිස්සීම ඔවුන් විසින් සිදු කරනු ලැබ ඇති බවට සාක්ෂි පවතී. ගල්ගුහා ආදී තමන්ගේ වාසස්ථාන හොඳින් උණුසුම් කර ගැනීමේ හැකියාව ද ඔවුහු සතුවූහ. නියැන්ඩර්තාල් මානවයා වඳවී යද්දී, සේපියන් ආරක්ෂා වීමට මෙය ද ප්‍රධාන හේතුවක් විය.



**වසර 100,000 - 120,000 ක් පමණ පැරණි, ඊශ්‍රායලයේ නසරේත්හි කාෆ්සේ ගුහාවෙන් හමුවූ හෝමෝ සේපියන් මානවයාට අයත් මවක සහ බිළිඳෙකුගේ භූම දානය කරන ලද අස්ථි කොටස්**

මෙම දියුණු සංස්කෘතික ලක්ෂණ වසර 1,00,000කට පමණ පෙර එක් අවස්ථාවකදීත්, වසර 40,000කට පමණ පෙර තවත් අවස්ථාවකදීත් පිමි ලෙස සංවර්ධනයවී ඇති බව පෙනී යයි. ආයුධ නිපැදවීම, ගින්දර හැසිරවීම මෙන්ම අනෙකුත් සංස්කෘතික ලක්ෂණ ද එලෙසම සංවර්ධනයට ලක්ව ඇත.

හෝමෝ සේපියන් මානවයා වසර ලක්ෂයකට පමණ පෙර සරල සංකේත භාවිත කළ බවට සාක්ෂි ඇතිවා මෙන්ම වසර 40,000කට පසු වඩා නිර්මාණශීලී සංකේත, රූප භාවිත කර ඇති බව පෙනී යයි. යුරෝපයේ මෙන්ම ඕස්ට්‍රේලියාවේ ද පෙර සඳහන් කළ දෙවන අවධියේදී ගුහා සිතුවම් ඇඳීම සිදුව ඇති බවට සාක්ෂි ඇත. කෙසේ නමුත්, වසර 1,00,000ත් 80,000ත් අතර කාලයේදී වර්ණ නිෂ්පාදනය කළ බවට සාක්ෂි දකුණු අප්‍රිකාවෙන් හමුව ඇත.

සංගීත උපකරණ භාවිතය පිළිබඳව දැනට ඇති පැරණිම සාක්ෂි හමුව ඇත්තේ, යුරෝපයෙනි. ඒ අදින් වසර 32,000කට පමණ පෙර ඒවා ය. වසර 30,000ත් 10,000ත් අතර කාලයට අයත් සත්ව අස්ථි මඟින් නිෂ්පාදිත නළා සහ බටනළා ගණනාවක් ප්‍රංශයෙන් සොයාගෙන ඇත. කැටයම් කැපීම සහ පිළිම නෙළීම අදින් වසර 35,000-40,000 අතර කාලයේදී ආරම්භ වන්නට ඇතැයි සැලැකේ. 'වීනස්' ලෙස නම් කරන ලද කාන්තා රූ ගණනාවක් මෙම අවධියට අයත් නෙළීම් ලෙස යුරෝපයේ රටවල් ගණනාවකින් හමුව ඇත. ජර්මනියෙන් හමුව ඇති වසර 35,000ක් පමණ පැරණි රුව සහ චෙක් රාජ්‍යයෙන් හමුව ඇති වසර 26,000ක් පැරණි ඇත්දළයකින් නිර්මිත කාන්තා හිස යන කලා කෘති ඊට උදාහරණ වේ.

හෝමෝ සේපියන් මානවයා ඇඳුම් භාවිත කළ බවට වන සෘජු සාක්ෂි අදින් වසර 30,000ක් පමණ ඈතට දිව යයි. මෙම ඇඳුම් සඳහා සත්ව සම් භාවිත කිරීම වැඩි වශයෙන් සිදුවන්නට ඇතැයි විශ්වාස කෙරේ. ඇඳුම් නිර්මාණය කිරීම සඳහා භාවිතළ කල ඉඳිකටු, බොත්තම්, පබලු ආදිය සොයා ගැනීමට විද්‍යාඥයෝ සමත් වී ඇත. කෙසේ නමුත්, තවමත් සාක්ෂි ලැබී නැතිමුත්, මීට වසර දහස් ගණනකට පෙර පටන් හෝමෝ සේපියන් මානවයන්, විශේෂයෙන් ශීත කලාපවල ජීවත් වූවන් ඇඳුම් භාවිත කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.

වසර 90,000කට පමණ පෙර භූමදානය කරන ලද කාන්තාවකගේ සහ ළදරුවකුගේ අස්ථි ඊශ්‍රායලයෙන් සොයාගෙන තිබේ. එලෙස කලක පටන් මිනී වළ දැමීම සිදුකරගෙන පැමිණි හෝමෝ සේපියන් වසර 40,000කට පමණ පසු එම චාරිත්‍ර වඩාත් සංකීර්ණ කරගෙන ඇති බව පෙනී යයි. ඒ අනුව මළ මිනී සමඟ ඔවුන්ගේ ආයුධ, ආභරණ වැනි දෑ භූමදානය කිරීම ඔවුහු සිදුකර ඇත. එසේම වළ තුල මිනී තැන්පත් කිරීමෙන් පසු ඒ මතට රතු හිරියල් ඉස ඇති බවට ද සාක්ෂි ලැබී තිබේ.

හෝමෝ සේපියන් මානවයා පිළිබඳ මුල්ම සාක්ෂි හමුවන්නේ උතුරු සහ නැගෙනහිර අප්‍රිකානු කලාපයෙනි. වසර ලක්ෂ 3කට පමණ පෙර බිහිවී එම කලාපවල පැතිර සිටි මෙම මානව විශේෂය වසර 2,00,000-1,50,000 අතර කාලයේදී සමස්ත අප්‍රිකානු මහාද්වීපය පුරා විසිර යන්නට ඇතැයි සැලැකේ. ඉන්පසු අදින් වසර 1,20,000කට පමණ පෙර වත්මන් පලස්තීන - ඊශ්‍රායල් භූමිය හරහා හෝමෝ සේපියන්ලා අප්‍රිකාව තරණය කර ඇත. අදින් වසර 70,000ත් 60,000ත් අතර කාලයේදී අප්‍රිකානු කලාපයෙන් බැහැර වීම විශාල වශයෙන් සිදුවන්නට ඇතැයි විශ්වාස කෙරේ. එතැන් සිට මැදපෙරදිග කලාපය හරහා ආසියාව ජනාවාසකරණය කළ හෝමෝ සේපියන් වසර 60,000කට පමණ පෙර අග්නිදිග ආසියාවට ළඟා විය. වසර

06 පිටුව

## ලෙනින් කියවමු...

08 - පිටුවෙන්

නමුත්, එය ප්‍රථම සන්නිකර්ෂණය ලෙසට පිළිගන්නා සැලැස්මක් වනු ඇත. පක්ෂ සම්මේලනයෙන් පමණක් වෙනස් කළ හැකි අපගේ නියම පක්ෂ වැඩපිළිවෙළ මෙන් නොව මෙම පක්ෂ වැඩපිළිවෙළ නොවෙනස් කළ හැක්කක් නොවේ. නැත. දිනෙන් දිනම සෑම පැක්ටරියකම සහ සෑම වොලොස්ට් වසමකම මෙම වැඩපිළිවෙළ වැඩිදියුණු කරනු ලැබේ; විස්තරාත්මක කරනු ලැබේ; අංගසම්පූර්ණ කරනු ලැබේ; වෙනස් කර සකසා ගනු ලැබේ. අපට එය අවශ්‍ය වන්නේ මුල් කෙටුම්පතක් ලෙසටය. කොමියුනිස්ට් ක්‍රමය සඳහා අවශ්‍ය වන නියම ආර්ථික පදනම මත රුසියාව පිහිටුවන්නේ කෙසේද යන්න සනිටුහන් කරමින්, දසවසරකට නොඅඩු කාලයක් සඳහා සකස් කළ මහා ආර්ථික සැලැස්මක් ලෙසට එය මුළු රුසියාවටම ඉදිරිපත් කරනු ලැබේ. යුද්ධ පෙරමුණෙහි ජය ගැනීමේදී අපගේ ධෛර්යය සහ ශක්තිය වැඩි වර්ධනය කළ ඉතාමත් බලවත් උනන්දුකාරකයන්ගෙන් එකක් වූයේ කුමක්ද? එය නම්, අන්තරාය ගැන වටහා ගැනීම විය. ඉඩම් හිමියන් සහ ධනපතියන් රුසියාවට ආපසු ඒමට ඉඩ ඇත්දැයි යන ප්‍රශ්නය කවුරුත් ඇසූහ. එයට දුන් පිළිතුර වූයේ එම ඉඩ ඇති බවය. එනිසා අපි අපගේ පරිශ්‍රමයන් සිය ගුණයකින් වැඩි කරගෙන ජයග්‍රහණය ලබා ගත්තෙමු.



"ආර්ථික පෙරමුණ ගෙන බලන්න. ආර්ථික වශයෙන් රුසියාවේ ධනපති ක්‍රමය යළි ස්ථාපනය කළ හැකිද යන ප්‍රශ්නය අසන්න. අපි 'සුහරෙව්කා' කළු කඩයට විරුද්ධව සටන් කළෙමු. මේ පසුගියදා සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනය ආරම්භ කිරීමට මඳකට පෙර මොස්කව්හි කම්කරු සහ රතු හමුදා නියෝජිත සෝවියට් සභාව, වැඩි සතුටක් නොඋපදවන එම ආයතනය වසා දැම්මේය (අත්පොළසන්). 'සුහරෙව්කා' කළු කඩය වසා තිබේ. නමුත්, දුෂ්ට ස්වභාවය ඇත්තේ, එම වෙළෙඳපොළ තුළ නොවේ. සුහරෙව්ස්කා චතුරශ්‍රයෙහි තිබුණු පැරණි 'සුහරෙව්කා' වෙළෙඳපොළ වසා දමන ලදී. එසේ කිරීම දුෂ්කර දෙයක් නොවීය. නමුත්, දුෂ්ටත්වය ඇත්තේ, සෑම සුළු දේපොළ හිමියකුගේ සිතෙහි සහ හැසිරීමෙහි රැඳී තිබෙන 'සුහරෙව්කාව' තුළය. වසා දැමිය යුත්තේ, එම 'සුහරෙව්කාව'ය. ධනපති ක්‍රමයේ පදනම වන්නේ එම 'සුහරෙව්කාව'ය. එය පවතින කල්හි ධනපතියන් ආපසු රුසියාවට පැමිණ අපට වඩා ශක්තිමත් වීමට ඉඩ තිබේ. එය පැහැදිලි ලෙස වටහාගත යුතු වේ. එම වැටහීම අප කරන වැඩකටයුතුවල මුල් උල්පත සහ අපගේ නියම ජයග්‍රහණ සලසන කොන්දේසිය හා ඒවායේ මිම්ම වන්නේය.

අප ජීවත් වන්නේ සුළු ගොවීන්ගේ රටකය. කොමියුනිස්ට් ක්‍රමයට වඩා ධනපති ක්‍රමයට සුදුසු ආර්ථික පදනමක් රුසියාවේ ඇත. එය සිතෙහි දරාගත යුතුය අප ධනපති ක්‍රමයේ මුල් උදුරා දමා නැති බවත්, අභ්‍යන්තර සතුරාගේ අත්තිවාරම නැතහොත්, පදනම දුර්වල කර නැති බවත් ගම්බද ජීවිතය ගැන සුපරීක්ෂාකාරී ලෙස නිරීක්ෂණය කරමින්, එය නාගරික ජීවිතය සමඟ සංසන්දනය කරන ඕනෑම කෙනෙක් දන්නේය. අභ්‍යන්තර සතුරා ඔහුගේ බලාපොරොත්තුව රඳවන්නේ කුඩා පරිමාණ නිෂ්පාදනය කෙරෙහිය. එය දුර්වල කිරීමට ඇත්තේ, එකම ක්‍රමයක් පමණකි. එය නම්, කෘෂිකර්මාන්තය ඇතුළත්ව රටේ ආර්ථිකය නව තාක්ෂණික පදනමක් මත, නවීන මහා පරිමාණ නිෂපාදනය මත පිහිටුවාලීමය. එම පදනම සම්පාදනය කෙරෙන්නේ විදුලි බලයෙන් පමණකි.

"**කොමියුනිස්ට් ක්‍රමය යනු සෝවියට් බලය** සහ මුළු රටම විද්‍යුතනය කිරීම යන දෙකෙහි එකතුවයි. එසේ නැතහොත්, රට සුළු ගොවියන්ගේ රටක් ලෙසින් පවතිනු ඇත. අපි එය පැහැදිලිවම වටහාගත යුත්තෙමු. අපි ධනපති ක්‍රමයට වඩා දුර්වල තත්ත්වයේ සිටිමු. ලෝක පරිමාණයෙන් පමණක් නොව රට තුළද එසේමය. එය කවුරුත් දන්නා දෙයකි. අපි එය අවබෝධ කොටගෙන සිටින්නෙමු. එනිසා ආර්ථික පදනම සුළු ගොවි පදනමක සිට මහා පරිමාණ කාර්මික පදනමකට පරිවර්තනය වන බවට අපි වගබලා ගන්නෙමු. අප සම්පූර්ණයෙන් ජයග්‍රාහී වන්නේ රට විද්‍යුතනය කළ විට සහ කර්මාන්තයත්, කෘෂිකර්මාන්තයත්, ප්‍රවාහණයත් නවීන මහා පරිමාණ කර්මාන්තයේ තාක්ෂණික පදනම මත පිහිටුවාලූ විට පමණකි; එවිට පමණකි.

"රට විද්‍යුතනය කිරීම සඳහා අපි දැනටමත් ප්‍රාථමික සැලැස්මක් සකස් කර ඇත්තෙමු. අපගේ හොඳම විද්‍යාඥයන් සහ කාර්මික ශිල්පීන් දෙසියයක් දෙනා එම කාර්යයෙහි යෙදුණහ. දීර්ඝ කාලයක් සඳහා, දස අවුරුද්දකට නොඅඩු කාලයක් සඳහා ද්‍රව්‍ය සහ මුදල් ඇස්තමේන්තු පෙන්නුම් කරන සැලැස්මක් අපට ඇත. විද්‍යුතනය කිරීමේ කටයුත්ත සඳහා අපට ගඩොල් කී ලක්ෂයක් අවශ්‍ය වේද යනුත්, සිමෙන්ති පීප්ප කී ලක්ෂයක් අවශ්‍ය වේද යනුත් මෙම සැලැස්මෙන් පෙන්නුම් කෙරේ. මුදල් පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් බලන කල විද්‍යුතනය කිරීම සඳහා ඇස්තමේන්තුව රන් රූබල් කෝටි 100 සහ 120 අතර වේ. අපගේ රත්රන් සංචිතයෙන් මෙම මුදල කොහෙත්ම ගෙවිය නොහැකි බව ඔබ දන්නෙහිය. අපගේ ගබඩාගත ආහාර ද්‍රව්‍ය තොගද එතරම් විශාල නොවේ. එනිසා අපට මෙම ඇස්තමේන්තුවල සඳහන් වියදම් දැරීමට සිදුවන්නේ මා සඳහන් කළ සැලැස්ම අනුව සහන මාර්ගයෙනි. මෙම පදනම මත අපගේ කර්මාන්තය සහ අපගේ ප්‍රවාහණය ප්‍රකෘතිමත් කිරීමට සැලැසුම් කර තිබෙන ආකාරය හා ඒ සම්බන්ධ ගණනය ඔබට දැකගත හැකිය.

"මොස්කව් ගුබෙර්නියාවේ ඈතින් පිහිටි වලකලම්ස්ක් උයෙස්ද් ප්‍රදේශයේ මෑතදී පැවැත්වුණු ගොවිජන උත්සවයකට සහභාගී වීමට මට අවස්ථාව ලැබිණ. එහි ගොවි ජනයාට විදුලි එළිය ඇත. වීදියෙහි රැස්වීමක් පැවැත්වීමට සූදානම් කර තිබිණි. එහිදී එක් ගොවියෙක් ඉදිරියට අවුත්, ගොවි ජනයාගේ ජීවිතයේ මෙම නව සිද්ධිය ගැන අගය කරමින් කතා කළේය. ගොවීන් වන අපි ආලෝකය නැතිව සිටියෙමුයි ඔහු කීවේය. නමුත්, දැන් අප අතරට ආලෝකය පැමිණ තිබේ. එය "අස්වාභාවික ආලෝකයකි. එය අපගේ වර්තමාන අන්ධකාරය දුරලනු ඇත." මට නම්, මෙම වචන පුදුමයක් නොවීය. පාක්ෂික නොවන ගොවි පොදු ජනතාවට විදුලි එළිය 'අස්වාභාවික' එළියක් බව සැබෑය. නමුත්, අප 'අස්වාභාවික' ලෙසට සලකන්නේ ගොවි ජනතාව හා කම්කරුවන් ඉඩම් හිමියන්ගේ සහ ධනපතියන්ගේ වියගසට බැඳී අවුරුදු සිය ගණන් සහ දහස් ගණන් එතරම් නොදියුණුව, දුප්පත්ව සහ පීඩිතව සිටීමය. මෙම අන්ධකාරය පසු කොට ඉතාමත් ශීඝ්‍ර ලෙස මතුවී ඒමට පුළුවන්කමක් ඔබට නොමැත. දැන් අප උත්සාහ දැරිය යුත්තේ, අප ගොඩනගන සෑම විදුලි බලස්ථානයක්ම පොදු ජනතාවට විදුලි බලය පිළිබඳ විඥානයක් යැයි කිව හැකි ආකාරයේ හැඟීමක් දීම සඳහා ඥානයේ බලකොටුවක් බවට හැරවීමටය. දුසිම් ගණනක් වන මෙම කුඩා විදුලි බලස්ථාන කර්මාන්තය ප්‍රකෘතිමත් කිරීම හා සමඟ සම්බන්ධවී තිබීමට හේතුව සියලු දෙනාටම පැහැදිලි කර දිය යුතුය. විද්‍යුතනකරණය සඳහා පිළිගත් සැලැස්මක් අපට ඇත. නමුත්, මෙම සැලැස්ම සම්පූර්ණ කිරීම සඳහා අවුරුදු ගණනාවක් ගත වන සේ එය සැලැසුම් කර තිබේ. මොන අමාරුවක් හෝ විඳ අප මෙම සැලැස්ම

07 පිටුව

## උද්ධමනය පාලනය වූ වසරක්....

01 - පිටුවෙන්

සිදුවේ. 02 වැනි වගුවේ සංඛ්‍යාලේඛනය ගණනය කළද, ආර්ථිකයේ අනෙකුත් අනුව රතුලූනු සඳහා තොග මිල සහ සිල්ලර මිල අතර සියයට 50ක මිල වෙනසක් ඇති අතර, දේශීය අර්තාපල් සඳහා සියයට 40ක මිල වෙනසක් ඇත. මේ තත්ත්වය වෙළෙඳපොළේදී පාරිභෝගිකයාට භාණ්ඩ මිලට ගැනීමේදී බලපානු ඇත.

උද්ධමනය ගණනය කිරීමේදී අදාළ කර ගන්නා භාණ්ඩ පැස තුළට අයත් වන භාණ්ඩ හා සේවා මිල අනුව දර්ශකය

වගු අංක 03

| මිල දර්ශකය | 2024 අගෝස්තු | 2025 අගෝස්තු | % වෙනස |
|---|---|---|---|
| **ජාතික පාරිභෝගික මිල දර්ශකය** - N.C.P. I | | | |
| මතුපිට උද්ධමන දර්ශකය | 204.1 | 207.2 | 1.5 |
| මූලික උද්ධමන දර්ශකය | 193.0 | 195.8 | 1.5 |
| **කොළඹ පාරිභෝගික මිල දර්ශකය** – C.C.P. I | | | |
| මතුපිට උද්ධමන දර්ශකය | 191.1 | 193.3 | 1.2 |
| මූලික උද්ධමන දර්ශකය | 177.3 | 180.9 | 2.0 |

අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිල පෞද්ගලික අංශය මගින් තීරණය කරන නිසා ගැටලුකාරී තත්ත්වයක් පවතී. රාජ්‍ය කළමනාකරණය යටතේ පවතින ආයතන සහ පාලන මිල අදාළ වන භාණ්ඩ සහ සේවා හැර අනෙකුත් භාණ්ඩ සම්බන්ධයෙන් පවතින මිල පාලනය කිරීමට ඇති හැකියාව අවම මට්ටමක පවතින නිසා ජනතාව අතර භාණ්ඩ මිල සම්බන්ධයෙන් පවතින ගැටලුව නිරාකරණය කරගැනීමට නොහැකිවී ඇත.

## මානව පරිණාමය

04-05 - පිටුවෙන්

50,000 - 45,000කට පෙර පැපුවා නිව්ගිනියා, ඕස්ට්‍රේලියාව ආදී ප්‍රදේශවලට සංක්‍රමණයවී ඇත. එසේම වසර 45,000කට පමණ පෙර යුරෝපයද ජනාවාසකරණය කිරීමට හෝමෝ සේපියන්ට හැකි විය. වසර 20,000ත් 15,000ත් අතර කාලයේදී උතුරු ඇමරිකාවටත්, ඒ හරහා දකුණු ඇමරිකාවටත් ඔවුහු සංක්‍රමණය වූහ. අවසානයේ වසර 5,000ත් 1,000ත් අතර කාලයකට පෙර පැසිෆික් දූපත් පවා ජනාවාසකරණය කිරීමට මෙම 'බුද්ධිමත් මිනිසා' සමත් විය.

මෙම සංක්‍රමණය අතරතුර යුරෝපයේදී නියැන්ඩර්තාල් මානවයා සමඟත්, මධ්‍යම ආසියාවේදී ඩැනිසෝවන් මානවයා සමඟත් හෝමෝ සේපියන් කොටසක් සුළු වශයෙන් මිශ්‍ර විය. එම මානව විශේෂවලට අයත් ජාන ලක්ෂණ වත්මන් ජන ප්‍රජාවන් තුළත් සුළු වශයෙන් පවතින්නේ එබැවිනි. ඊට අමතරව නැඟෙනහිර සහ අග්නිදිග ආසියාවේදී හෝමෝ ඉරෙක්ටස් සමඟත් ඉන්දුනීසියාවේදී හෝමෝ ෆ්ලොරේසියන්සිස් සමඟත් පිලිපීනයේදී හෝමෝ ලුසෝනෙන්සිස් සමඟත් අසල්වැසියන් ලෙස හෝමෝ සේපියන්ලා සමකාලීනව ජීවත්වී ඇත.

## ලෙනින් කියවමු...

06 - පිටුවෙන්

සපුරාලිය යුත්තෙමු. එමෙන්ම එය සඳහා ගත කරන කාලයද අඩු කළ යුත්තෙමු. අපගේ මුල්ම ආර්ථික සැලැස්මවලින් එකක්වූ ප්‍රවාහණය ප්‍රකෘතිමත් කිරීම සඳහාවූ සැලැස්ම - නියෝග අංක 1042 අවුරුදු පහකින් සපුරාලීමට අරමුණු කර තිබුණු නමුත්, අප වැඩසටහනට වඩා ඉදිරියට ගොස් සිටින නිසා එම කාලය අවුරුදු තුනහමාරක් දක්වා අඩු කර තිබේ. මෙහිදීද එම සාර්ථකත්වයම ලැබිය යුත්තෙමු. විද්‍යුතනය කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ධනපති ක්‍රමය වෙත නැවත කිසිසේත් ආපසු යාමට නොහැකි වනසේ වෙනස්කම් ඇති කරනු සඳහා අපට අවුරුදු දහයේ සිට විස්ස දක්වා කාලයක් අවශ්‍ය වනු ඇත. මෙය ලෝකයේ පෙර කිසිම තැනෙක නොදක්නා ලද විරූ ශීඝ්‍ර සමාජ සංවර්ධනයක ආදර්ශයක් වනු ඇත. කොතරම් අමාරුකම් තිබුණත්, මෙම සැලැස්ම සම්පූර්ණ කළ යුතුය. එසේම එය නිම කිරීමට නියමිත දිනය තවත් මෑත් කළ යුතුය.

"නිදසුනක් ලෙසට ප්‍රවාහණ ක්‍රමයේ මෙන් තනි කාර්මික කොට්ඨාසයන් තුළ උද්ගතවූ සහ කර්මාන්තයේ අනෙකුත් අංශවලට ගෙන යන ලද ඒ ඒ කොට්ඨාසයට වෙන්වූ සැලැසුම්වලට අමතරව අවුරුදු ගණනාවක් සඳහා ගණනය කොට සකස් කළ සමස්තමය සැලැස්මක්ද දැන් අපට ඇත. මේ ආකාරයෙන් ආර්ථික වැඩ කිරීමට අප යොමුවූ ප්‍රථම අවස්ථාව මෙයයි. මේවා කොමියුනිස්ට් ක්‍රමයේ ජයග්‍රහණය උදා කිරීම සඳහා කළ යුතුව තිබෙන අමාරු කාර්යයන් වන්නේය.

"නමුත්, අපට සිටින නූගතුන් සමගින් විද්‍යුතනය කිරීම ක්‍රියාත්මක කළ නොහැකි බව අප අවබෝධ කරගත යුතුය; මතක තබාගත යුතුය. නූගත්කම අකා-මකා දැමීමට අපගේ කොමිසම ප්‍රයත්න දරනු ඇත. නමුත්, එය ප්‍රමාණවත් නොවේ. අතීතය සමඟ සසඳන කල එය විශාල වැඩ කොටසක් ඉටු කර තිබෙන නමුත්, කළ යුතුව තිබෙන දේ සමඟ සසඳන කල ඉටු කර තිබෙන කොටස අල්පය. අකුරු දැනුම පමණක් නොව සංස්කෘතිකමත් බව, ඥානවත් බව හා ශික්ෂිත බවද ලැබූ වැඩ කරන ජනයා අපට අවශ්‍යය. ගොවි ජනයාගෙන් බහුතරයකට අප ඉදිරියේ ඇති කර්තව්‍යයන් ගැන අවබෝධයක් ලබා දිය යුතුය. පක්ෂයේ මෙම වැඩපිළිවෙළ සෑම පාසලකම ප්‍රයෝජනයට ගන්නා මූලික පොතක් විය යුතුය. විද්‍යුතනකරණය සඳහාවූ පොදු සැලැස්මට අමතරව රුසියාවේ සෑම දිස්ත්‍රික්කයක්ම සඳහා වෙන වෙනම සැලැසුම් එහි ඇතුළත් කොට තිබෙන බව ඔබට පෙනෙනු ඇත. මේ අනුව බලන කල පළාත්වලට යන සෑම සහෝදරයකුම සමඟ ඔහුගේ දිස්ත්‍රික්කය විද්‍යුතනය කිරීමේ නිශ්චිත සැලැස්මක් තිබෙනු ඇත. එය අන්ධකාරයෙන් සහ නොදැනුම්වත්කමෙන් සාමාන්‍ය ජීවිතයකට පරිවර්තනයවීම සඳහාවූ යෝජනාක්‍රමයකි. තවද සහෝදරවරුනි, ඔබට ඉදිරිපත් කර තිබෙන ප්‍රවාද සංසන්දනය කර බැලීම, ඒවාට විස්තර එකතු කිරීම හා අදාළ තැනෙහිදීම ඒවායෙහි හරි, වැරදි බැලීම ඔබට කළ හැකිය. ඔබ එසේ කළ යුතුය. ඕනෑම පාසලකදී, ඕනෑම අධ්‍යයන කවයකදී කොමියුනිස්ට්වාදය කුමක්ද යන ප්‍රශ්නය අසනු ලැබූ කල ඊට දෙන පිළිතුරෙහි අඩංගු විය යුත්තේ, පක්ෂ වැඩපිළිවෙළෙහි ලියා ඇති දේ පමණක් නොවේ. නූගත් තත්ත්වයෙන් අපට ගොඩ ආ හැක්කේ කෙසේද යන්නත් එම පිළිතුරෙන් කිව යුතු වේ.

"රුසියාව විද්‍යුතනය කිරීම සහ ඇයගේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා සැලැස්මක් සකස් කරනසේ අපගේ ශාහඳම මිනිසුන්ට, අපගේ ආර්ථික විශේෂඥයන්ට අප පැවරූ කර්තව්‍යය ඔවුන් විසින් ඉටු කර තිබේ. මෙම කර්තව්‍යය කොතරම් ශ්‍රේෂ්ඨද, කොතරම් දුෂ්කරද යන්න සහ එයට සමීප විය යුත්තේ සහ එය ඉටු කළ යුත්තේ කෙසේද යන්න ගැන කම්කරුවන්ට සහ ගොවි ජනතාවට අවබෝධයක් ලැබෙන බවට අපි වග බලාගත යුත්තෙමු.

"සෑම පැක්ටරියක්ම, සෑම විදුලි බලස්ථානයක්ම දැනුම පතුරුවන මධ්‍යස්ථානයක් වන බවට අපි වග බලාගත යුත්තෙමු. රුසියාව සෑම තැනම සනව වසා සිටින ජාලකයක්සේ විදුලි බලස්ථාන සහ තාක්ෂණික යන්ත්‍ර ස්ථාන පැතිරී තිබේ නම්, අපගේ කොමියුනිස්ට් ආර්ථික සංවර්ධනය අනාගත සමාජවාදී යුරෝපයට සහ ආසියාවට ආදර්ශයක් වනු ඇත (වේගවත් සහ දීර්ඝ අත්පොළසන්).

1921 වර්ෂයේදී 'අට වැනි සමස්ත රුසියා කම්කරු, ගොවි ජන, රතු හමුදා සහ කොසාක් නියෝජිතයන්ගේ සෝවියට් සභා සම්මේලනය, සම්පූර්ණ වාර්තාව' යන ප්‍රකාශනයෙහි පළ කරන ලදී.

**(ලෙනින්, 11 වැනි වෙළුම)**

# ලෙනින් කියවමු...

**"දැන් මම අවසාන කරුණ ගැන සඳහන් කරන්නෙමි. එය නම්, විශේෂ ප්‍රශ්නයක් වශයෙන් න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙන විද්‍යුතනය පිළිබඳ ප්‍රශ්නයයි. මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඔබ වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. අප ඉදිරියේ ඉතා වැදගත් වෙනස්වීමක් සිදු වෙමින් පවතින බව මම අදහස් කරමි.**

## දේශීය සහ විදේශීය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් සමස්ත රුසියා විධායක කාරක සභාවේ මහජන කොමිසාර් මණ්ඩලයේ වාර්තාවෙන් උපුටනයක්.

**(තෝරා ගත් කෘති, 11 වෙළුම, 122-129 පිටු.)**

එයවූ කලී සෝවියට් බලයේ වැදගත් ජයග්‍රහණවල ආරම්භය සලකුණු කරන වෙනස්වීමකි. මින් ඉදිරියට සමස්ත රුසියා සම්මේලනයේ වේදිකාවට දේශපාලකයන් හා පරිපාලකයන් පමණක් නොව ඉංජිනේරුවරුන් සහ ශස්‍ය විද්‍යාඥයන්ද නැගෙනු ඇත. මෙයින් සලකුණු වන්නේ දේශපාලනය පසුතලයට යන, දේශපාලනය ගැන සාකච්ඡා කෙරෙන අවස්ථා ගණන අඩු වන හා වඩාත් කෙටියෙන් සාකච්ඡා කෙරෙන, කතා කිරීම වැඩියෙන්ම ඉංජිනේරුවන්ට සහ ශස්‍ය විද්‍යාඥයන්ට භාර වන ඒ ඉතා වාසනාවන්ත කාලයේ ආරම්භයයි. ආර්ථික සංවර්ධනයේ කටයුතු නියම වශයෙන් කරගෙන යනු පිණිස සමස්ත රුසියා සෝවියට් සභා සම්මේලනයේදීද, සියලුම සෝවියට් සභාවල සහ සංවිධානවලද, ප්‍රවෘත්ති පත්‍රවලද, ප්‍රචාරක සහ උද්ඝෝෂණ ආයතනවලද, සියලුම අවස්ථාවලදීද ඉහළ සිට පහළ දක්වාම මෙම සිරිත ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ යුතුය.

"අප දේශපාලනය උගෙන තිබෙන බව නිසැකය. ඒ අතින් අපි පර්වතයක් මෙන් ස්ථිර වෙමු. නමුත්, ආර්ථික කරුණු සම්බන්ධයෙන්වූ කල තත්ත්වය සතුටුදායක නොවේ. මින් ඉදිරියට හොඳම දේශපාලනය වනු ඇත්තේ, දේශපාලනය අඩු කිරීමය. වැඩි වැඩියෙන් ඉංජිනේරුවරුන් සහ ශස්‍ය විද්‍යාඥයන් ඉදිරියට ගෙන එන්න. ඔවුන්ගෙන් උගෙන ගන්න. ඔවුන්ගේ වැඩ ගැන සෝදිසියෙන් නිරීක්ෂණය කරන්න. එමෙන්ම අපගේ සම්මේලන සහ සාකච්ඡා සභා ප්‍රචාරක රැස්වීම්වලට නොව අපගේ ආර්ථික ජයග්‍රහණයන් පුනරීක්ෂණය කරන මණ්ඩල බවට, ආර්ථික සංවර්ධනයේ කාර්යය නියම වශයෙන් උගෙන ගැනීමේ මණ්ඩල බවට හරවන්න.

"සමස්ත රුසියා මධ්‍යම විධායක කාරක සභාවේ 1920 පෙබරවාරි 7 වැනි දින රැස්වීමේ තීරණය අනුව පිහිටුවන ලද රාජ්‍ය විද්‍යුතනකරණ කොමිසමේ වාර්තාව ඔබට ඉදිරිපත් කරනු ඇත. මෙම කොමිසමේ සංයුතිය නිශ්චය කරන අවසාන ආඥාව ජාතික ආර්ථිකය පිළිබඳ මහා මණ්ඩලයේ සභාපති මඬුල්ල විසින් පෙබරවාරි 21 වැනි දින අත්සන් කරන ලදී. ප්‍රධාන පෙළේ හොඳම විශේෂඥයන් හා කාරකවරුන්



> **"අප දේශපාලනය උගෙන තිබෙන බව නිසැකය. ඒ අතින් අපි පර්වතයක් මෙන් ස්ථිර වෙමු. නමුත්, ආර්ථික කරුණු සම්බන්ධයෙන්වූ කල තත්ත්වය සතුටුදායක නොවේ. මින් ඉදිරියට හොඳම දේශපාලනය වනු ඇත්තේ, දේශපාලනය අඩු කිරීමය. වැඩි වැඩියෙන් ඉංජිනේරුවරුන් සහ ශස්‍ය විද්‍යාඥයන් ඉදිරියට ගෙන එන්න. ඔවුන්ගෙන් උගෙන ගන්න. ඔවුන්ගේ වැඩ ගැන සෝදිසියෙන් නිරීක්ෂණය කරන්න. එමෙන්ම අපගේ සම්මේලන සහ සාකච්ඡා සභා ප්‍රචාරක රැස්වීම්වලට නොව අපගේ ආර්ථික ජයග්‍රහණයන් පුනරීක්ෂණය කරන මණ්ඩල බවට, ආර්ථික සංවර්ධනයේ කාර්යය නියම වශයෙන් උගෙන ගැනීමේ මණ්ඩල බවට හරවන්න."**

ගණනාවක් ඔවුන්ගේ මුළු ශක්තිය යොදා මෙම වැඩෙහි යෙදෙති. එම විශේෂඥයන් සහ කාරකවරුන් ප්‍රධාන වශයෙන් එනම්, සියයකට වැඩි සංඛ්‍යාවක් ජාතික ආර්ථිකය පිළිබඳ මහා මණ්ඩලයෙන්ද, තවත් අය දුම්රිය කටයුතු භාර කොමිසාර් අංශයෙන් හා කෘෂිකර්මාන්ත කටයුතු භාර කොමිසාර් අංශයෙන්ද ලබා ගත් අයය. රුසියාවේ විද්‍යුතනකරණ රාජ්‍ය කොමිසමේ කටයුතුවල ප්‍රතිඵල අප හමුවේ තබා ඇත. මෙම කුඩා වෙළුමෙහි ස්වරූපයෙන් ඉදිරිපත් කර තිබෙන එය අද, නැතහොත්, හෙට ඔබට බෙදා දෙනවා ඇත. මෙම කුඩා වෙළුම දැක ඔබ බියක් ඇති කර නොග නිතියි මම විශ්වාස කරමි. මෙම පොතේ විශේෂ වැදගත්කම ගැන ඔබට වටහා දීම මට අපහසු නොවේ යැයි මම සිතමි. මගේ අදහසේ හැටියට එය අප පක්ෂයේ දෙවැනි වැඩපිළිවෙළ ලෙසට සැලැකිය යුතුය. ප්‍රියබ්‍රෂෙන්ස්කි සහ බුහාරින් යන සහෝදරවරුන් විසින් ඉතා අගනා ලෙස පැහැදිලි කරන ලද ඒ පක්ෂ වැඩපිළිවෙළ අපට ඇත. එය මෙතරම් විශාල නැති එහෙත්, ඉතාමත් ප්‍රයෝජනවත් පොතක් ලෙසට ඉදිරිපත් කර තිබේ. එය නම්, දේශපාලන වැඩපිළිවෙළය. එය අපගේ අරමුණු සහ පන්ති හා පොදු ජනතාව අතර සම්බන්ධකම් විස්තර කෙරෙන ලියැවිල්ලකි. නමුත්, සත්‍ය වශයෙන්ම මෙම මාර්ගයේ ගමන් කිරීමටත්, ඉන් ලබා ගත් ප්‍රායෝගික ප්‍රතිඵල මැන බැලීමටත් දැන් කාලය පැමිණ තිබෙන බව අමතක නොකළ යුතුය. අප පක්ෂ වැඩපිළිවෙළ තනිකරම පක්ෂයේ වැඩපිළිවෙළක් ලෙසට නොතිබිය යුතුය. එය අපගේ ආර්ථික සංවර්ධනයේ වැඩපිළිවෙළක් විය යුතුය. නොඑසේ නම්, එය පක්ෂයේ වැඩපිළිවෙළක් ලෙසට වුවද, වටිනාකමෙන් තොර වනු ඇත. ඊට අතිරේකයක් ලෙස දෙවැනි පක්ෂ වැඩපිළිවෙළක් තිබිය යුතුය. එය මුළුමහත් ආර්ථිකයම ප්‍රකෘතිමත් කිරීමේ සහ එය නවීන තාක්ෂණික සංවර්ධනයේ මට්ටමට නඟාසිටුවීමේ සැලැස්මක් විය යුතුය. විද්‍යුතනකරණය සඳහා සැලැස්මක් නොමැතිව අපට කිසිම නියම නිර්මාණාත්මක වැඩක් කළ නොහැකිය. අප සාකච්ඡා කරන්නේ කෘෂිකර්මාන්තය, කර්මාන්තය සහ ප්‍රවාහණය ප්‍රකෘතිමත් කිරීම සහ ඒවායේ සංගත සම්බන්ධීකරණය ගැන වන කල්හි අපට පුළුල් ආර්ථික සැලැස්මක් සාකච්ඡා කිරීමට සිදු වන්නේමය අපි නිශ්චිත සැලැස්මක් අනුමත කළ යුත්තෙමු.